# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1792/6 – 2013 ජනවාරි 08 වැනි අඟහරුවාදා – 2013.01.08

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/21/02/2009.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2010 ජනවාරි මස 21 වැනි දින අංක 1637/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010 ජනවාරි මස 13 වැනි දින දරන නියෝගයෙන්,

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, (යූනියන් පෙදෙස), කොළඹ 02.

සහ

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී.එල්.සී, අංක 248, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර පවත්නා 2010 ජනවාරි මස 12 වන දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණ පිලිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2010 ජනවාරි මස 13 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

01 - 623/1

මගේ යොමු අංකය: IR/21/02/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත (යූනියන් පෙදෙස), කොළඹ 02.

සහ

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී.එල්.සී., අංකා 248, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/21/02/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, (යූනියන් පෙදෙස), කොළඹ 02.

සහ

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී.එල්.සී. අංක 248, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි සේවයේ නියුතු මෙහි පහත නම් සඳහන් සේවකයින් විසිඅට (28) දෙනා විසින් 2009.10.12 දින සිට පවත්වන ලද වැඩ වර්ජනය නීත්‍යානුකූල වන්නේ ද නීත්‍යානුකූල නොවන්නේද යන්න හා නීත්‍යානුකූල වන්නේ නම් ඔවුනට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

01. එල්. එච්. ජගත් වික්‍රමසිංහ
02. ආර්. ඒ. වීරසිංහ
03. ඩී. ජී. සිරිමෙවන් ආටිගල
04. එස්. එල්. විජිත චමින්ද
05. ඇන්ටනී ස්කොට්
06. එච්. කේ. රසික ප්‍රියංකර ප්‍රනාන්දු
07. බී. ඒ. අසන්ත සංජීව පෙරේරා
08. එම්. ධනුෂ්ක පීරිස්
09. ඩබ්. එච්. සී. ප්‍රසාද් ප්‍රනාන්දු
15. එම්. කේ. නුවන් කුමාර අල්විස්
16. චමිල කුමාර සුරවීර
17. දිනේස් සංජීව සෝමසිරි
18. ජේ. ඒ. ලාල් ජයසූරිය
19. ඩී. ජී. වසන්ත කුමාර
20. මුදුන්කොටුවගේ සුරංග සංජීව
21. කේ. එම්. ලාල්
22. කේ. ඒ. ගාමිණී කුමාරසිංහ
23. කේ. ඒ. ජස්ටින් රාජ්

10. ඩී. අනෝෂ් චින්තක බාලචන්ද්‍ර
11. ජේ. ඒ. අජන්ත ජයසිංහ
12. කේ. එල්. එස්. තිලූෂණ
13. චමත් ප්‍රසන්න විජේනායක
14. කේ. පී. එල්. අමිල කරුණානායක
24. කේ. ජෙබම්
25. ඩබ්. ඒ. අනුරුද්ධ ප්‍රදීප් කුමාර
26. එම්. එම්. සමිත චන්දිමාල්
27. එච්. ඩී. ගාමිණී වීරසිංහ
28. කේ. ඩී. සුමිත් මංජුල

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 - 623/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.